දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/06-05/03/2015

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2020.01.30

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 04/2020

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් දරන නිලධාරියකු විසින් කරනු ලබන ඉල්ලීමක් අනුව මධ්‍යම රජයේ අනුරූපී තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම**

මධ්‍යම රජයේ තනතුරකට අනුරූපී පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර පත්වීමක් දරණ හෙද, පරිපූරක, අතුරු වෛද්‍ය හා ගුරු සේවය වැනි මධ්‍යම රජය යටතේ මූලික පුහුණුව ලබාදීමෙන් පසු පළාත් රාජ්‍ය සේවයේ පත්වීමක් ලද නිලධාරියකුගේ හෝ සංවර්ධන නිලධාරි සේවය යටතේ පළාත් රාජ්‍ය සේවයේ පත්වීමක් ලද නිලධාරියකුගේ ඉල්ලීම අනුව එම නිලධාරියා මධ්‍යම රජයේ තනතුරක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් බඳවා ගැනීමේ බලතල පවරන ලද පත්වීම් බලධරයකු විසින් පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව ස්ථාන මාරු කරනු ලැබිය හැක්කේය.

02. පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කරන පළමු ඡේදයේ විස්තර කර ඇති පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු පමණක් පළාත් රාජ්‍ය සේවයේ තනතුරට අනුරූපී මධ්‍යම රජයේ තනතුරකට පත්කිරීමට සුදුසුකම් ලබන්නේය.

i. පළාත් රාජ්‍ය සේවයේ විධායක මට්ටමේ නිලධරයින් හා තෘතීයික මට්ටමේ විශේෂ ශ්‍රේණියේ නිලධරයින් මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මධ්‍යම රජයේ තනතුරක් සඳහා පත් කළ නොහැක්කේය.

ii. නිලධරයාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ ආරම්භ කිරීමට සූදානමක් හෝ නොමැති විය යුතුය.

iii. පළාත් රාජ්‍ය සේවයේ සේවා කාලය තුළදී ඊට අදාළ වන කිසියම් කරුණක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගයක් එම නිලධාරියාට එරෙහිව නොපැවතිය යුතුය.

iv. අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එම නිලධාරියා පළාත් රාජ්‍ය සේවයෙන් ස්ථිරව මුදා හැරීමට එකඟතාවය ලබා දී තිබිය යුතුය.

v. නිලධාරියා විසින් නව පත්වීම් බලධරයාගේ එකඟතාවය ලබා ගැනීමට පෙර මෙම චක්‍රලේඛයේ විධිවිධාන වලට එකඟව මධ්‍යම රජයේ තනතුර භාරගනු ලබන බවටත් දිවයිනේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට එකඟ වන බවටත් වන දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුත්තේය.

03. එලෙස ස්ථාන මාරු කරනු ලබන නිලධාරියකුගේ ජ්‍යෙෂ්ඨතාවය නිලධාරියා පළාත් රාජ්‍ය සේවයේ තනතුරට බඳවා ගනු ලැබූ දිනයේදී මධ්‍යම රජය යටතේ තනතුරකට බඳවා ගනු ලැබූවායැයි සලකා තීරණය කළ යුතුය. එලෙස වුවද, ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන්නාවූ හෝ පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉහළ තනතුරකට උසස් කරනු ලබන්නාවූ හෝ පරීක්ෂණයක් සඳහා පහත සඳහන් අවස්ථාවලදී හැර මධ්‍යම රජයේ තනතුරකට අන්තර්ග්‍රහණය කර වසර තුනක් (03) යන තුරු සුදුසුකම් නොලබන්නේය.

i. ලිඛිත පරීක්ෂණයක කුසලතාවය අනුව උසස් කරනු ලබන අවස්ථාවකදී
ii. සාමාන්‍ය කාර්යසාධනය යටතේ ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කරනු ලබන අවස්ථාවකදී
iii. උසස් කිරීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති අවස්ථාවකදී
iv. ස්ථාන මාරු නොවී දිගටම පළාත් රාජ්‍ය සේවයේ තනතුරෙහි රැඳී සිටියේ නම් සුදුසුකම් ලබන්නාවූ මධ්‍යම රජයේ තනතුරක් සඳහා හෝ දීප ව්‍යාප්ත සේවාවක් සඳහා හෝ සීමිත හෝ කුසලතා ධාරාව යටතේ ඉල්ලුම් කරන අවස්ථාවකදී

04. පළාත් රාජ්‍ය සේවය හා මධ්‍යම රජයේ රාජ්‍ය සේවය එකිනෙකට වෙනස් සේවාවන් වන බැවින් මෙවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් පත්වීම් බලධරයා හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අන්‍යෝන්‍ය එකඟතාවයක් අනුව කටයුතු කළ යුත්තේය.

05. ඉහත පරිදි ස්ථාන මාරු කරනු ලබන නිලධරයකුගේ පත්වීම් බලධරයා හා විනය බලධරයා වෙනස් වන බැවින් අදාළ වන්නා වූ නව සේවා කොන්දේසි සහිතව පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසිවලට යටත්ව රජයේ සේවයේ තනතුරකට අන්තර්ග්‍රහණය කරනු ලබන බවට ලිපියක් නිකුත් කළ යුත්තේය.

06. මෙම විධිවිධානයන් ප්‍රසිද්ධ කරනු ලැබූ දිනට පෙර පළාත් රාජ්‍ය සේවයේ සිට මධ්‍යම රජයේ තනතුරු සඳහා ස්ථාන මාරුවී සිටින පළමු ඡේදයේ විස්තර කර ඇති නිලධාරීන්ට මෙම විධිවිධානයන් අනුව රජයේ තනතුරට ස්ථාන මාරු කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි අන්තර්ග්‍රහණය කරනු ලබන බවට ලිපියක් නිකුත් කළ යුත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්. ජී. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව